## 8 "ආ" ආකෘතිය

## <u>පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට භාවිතා කරන වාහනවලට අනුමැතිය ලබා දීම</u>

01. අයදුම්කරුගේ නම හා ලිපිනය :- ..........................................................................

..........................................................................

..........................................................................

02. වාහනයේ ලියාපදිංචි අංකය :- ..........................................................................

03. වාහනයේ අයිතිකරුගේ නම හා ලිපිනය :- ..........................................................................

..........................................................................

..........................................................................

04. පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධව 1979.02.13 දින අංක 23/5 දරන ගැසට් පත්‍රයේ 10 වන උපලේඛනයේ **අංක 3, 5, 8, 9, 13, 14, 15, 17, 21, 26 සහ 27 ඡේද** පිළිබඳව මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය

**නිර්දේශ කරමි. / නොකරමි.**

**මෙම වාහනයේ කිලෝ ග්‍රෑම් ...................................... ක ප්‍රමාණය නොඉක්මවා ප්‍රවාහනය කළ හැකිය.**

දිනය :- 202............ ....................................

**ප්‍රධාන මෝටර් රථ පරීක්ෂක**

05. පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධව 1979.02.13 දින අංක 23/5 දරන ගැසට් පත්‍රයේ 10 වන උපලේඛනයේ අංක **3, 5, 8, 9, 13, 14, 15, 17, 21, 26 සහ 27** දක්වා වූ කොන්දේසිවලට අනුකූලව ඉහත වාහනය පවත්වා ගැනීමට හා ප්‍රවාහන කටයුතු කිරීමේ දී එම කොන්දේසි ප්‍රකාරව කටයුතු කිරීමට ද වාහනයේ යම් කිසි වෙනසක් වන්නේ නම් ඒ බව වහාම දැනුම් දීමට එකඟ වෙමි.

දිනය :- 202........... ............................

අයදුම්කරුගේ අත්සන

06. අංක .................................................................... දරන වාහනයේ ආරක්ෂිතව පුපුරන ද්‍රව්‍ය **කිලෝ ග්‍රෑම් ................ (..............................................)** ක ප්‍රමාණය නොඉක්මවා ප්‍රවාහනය කිරීම සඳහා සුදුසු වාහනයක් බව අනුමත කරමි.

**මෙම අනුමැතිය වලංගු වන්නේ සහකාර පුපුරන ද්‍රව්‍ය පාලක විසින් අත්සන් කර ඇති දිනයේ සිට අවුරුද්දක් දක්වා පමණි.**

දිනය :- 202........... ......................................

## 1979.02.13 දින අංක 23/5 දරන ගැසට් පත්‍රයේ පුපුරන ද්‍රව්‍ය නියෝගයන්හි 10 වන උපලේඛනයේ අංක 3, 5, 8, 9, 13, 14, 15, 17, 21, 26 සහ 27 ඡේද

**3.** යතුරු දැමිය නොහැක්කාවූ ද, බලපත්‍ර අධිකාරි විසින් ලිපියකින් අනුමත නොකරනු ලැබුවාවූ ද, යන්ත්‍රානුසාරයෙන් දිවෙන වාහනයක පුපුරන ද්‍රව්‍ය පටවාගෙන නොයා යුතුය. එසේ වුවද, යතුරු දැමිය හැකි ලෙස හා ශක්තිමත්ව තැනුවාවූ ද, විශේෂයෙන් පුපුරන ද්‍රව්‍ය පටවා යැවීම පිණිස යොදා ගනු ලැබුවාවූ ද, ගමනේදි ඇතුලත නොසෙල්වන බාහණයට ස්ථිර ලෙස සවිකර ඇත්තාවූ ද භාජනයක දමා නම් විවෘත වාහනයක පුපුරන ද්‍රව්‍ය ගෙන යා හැක.

**5.** පුපුරන ද්‍රව්‍ය ගෙන යනු ලබන වාහනවල සතර පැත්තේම " පුපුරන ද්‍රව්‍ය " යන වචනය පැහැදිලිව සළකුණු කල යුතුය. වර්ග අඩියකට (වර්ග සෙන්ටි මීටර් 900) අඩු නොවූ රතු කොඩියක් ද, එම වාහනයේ ප්‍රකටව පනෙන තැනක සවිකල යුතුය.

**8.** ලීයෙන් හෝ ලෝහයෙන් හෝ සතර පැත්තේම ආවරණය කල වාහනයක ගෙන යනු ලබන පුපුරන ද්‍රව්‍ය, පිටතින් ඇතිවන ගින්නකින් පැන නැගිය හැකි හදිසි උවදුරුවලින් සඵලාකාරයෙන් ආරක්‍ෂා වන පරිදි යොදා නැත්නම්, පුපුරන ද්‍රව්‍ය පින්තාරු කල රෙද්දකින්, කුඩාරම් රෙද්දකින්, ඝන රෙද්දකින් හෝ වෙනයම් සුදුසු ද්‍රව්‍යයකින් වසා තැබිය යුතුය.

**9.** පුපුරන ද්‍රව්‍ය ගෙන යන වාහනයක ඇතුලත කිසිම යකඩ හෝ වානේ දෙයක් නොතිබිය යුතුය. එහෙත් යට කියන ලද නොවැසූ යකඩ හෝ වානේ හෝ යමක් ඇත්නම් එය ස්ථිරව හෝ තාවකාලිකව හෝ සමින්, ලීයෙන්, රෙදිවලින් හෝ වෙන යම් සුදුසු ද්‍රව්‍යයකින් යෝග්‍ය පරිදි වසා තැබිය යුතුය.

**13.** පැට්‍රෝල් ස්පිතුවෙන් හටගත් ගින්නක් නිවා දැමිය හැකි යෝග්‍ය ප්‍රමාණයේ කාර්යක්‍ෂම රසායනික ගිනි නිවන උපකරණයක් වාහනයෙහි ගෙන යා යුතුය.

**14.** වාහනයේ තට්ටුව සහිත රිය බඳ පිටතින් තහඩු ලෝහයෙන් සම්පූර්ණයෙන් ආවරණය කොට ඇතුලතින් ඇස්බැස්ටෝස් හෝ ගිනි නොගන්නා ලෙස සකස් කල ලී පුවරු හෝ යොදා වැසිය යුතුය.

**15.** පිටුපසින් පමණක් සවි කොට ඇති මනා ලෙස පියවෙන දොර හැර වෙන අන් කිසිම විවරයක් රිය බඳෙහි නොවිය යුතුය.

**21.** සුදුසු පරිදි සවිකල ටැංකිවල හැර පුපුරන ද්‍රව්‍ය ගෙන යන කිසිම වාහනයක ඉන්ධන රැගෙන නොයා යුතුය. ඉන්ධන ටැංකිය පුරවන විට ඇන්ජිම නතර කල යුතුය.

**26.** කර්මාන්ත ශාලාවෙන් හෝ ගබඩාවෙන් මෝටර් වාහන පිටත් වීමට ප්‍රථම,

(අ) විදුලි ඇතියුම්රේටර සහ ස්විච් යතුරු පුවරුව අතර පරිවරණය හෝ කව්චය ප්‍රමාණවත් බවට ද,

(ආ) ඉන්ධන ටැංකියෙන්, කාබියුරේටරයෙන් සහ ඉන්ධන භාරක සම්බන්ධ නලයකින් (ඉන්ධන) වැස්සීමක් නැති බවට ද,

(ඇ) පැටවූ ද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි සුරක්‍ෂිත බවට ද,

(ඈ) වාහනයක සාමාන්‍යයෙන් වැඩට සුදුසු තත්වයක ඇති බවට ද, රියදුරා විසින් වග බලා ගත යුතුය.

**27.** වාහනය හදිසි අනතුරකට පාත්‍රවූ විටක දී හෝ රියදුරාට අළුත්වැඩියා කිරීමට නොහැකි අන්දමට ක්‍රියා විරහිත වූ විටක දි හෝ පහත සඳහන් පියවර ගත යුතුය.

(අ) එක් තැනැත්තෙකු වාහනය සමඟ නතර වී සිටිය දී අනිකකු වාහනයේ ඇති පුපුරන ද්‍රව්‍යයද සඳහන් කරමින් ළඟම පොලීසියට දුරකථනයෙන් දැන්විය යුතුය.

(ආ) එසේම, ඇඳිරි වැටුණු පසු ආපදා සංඥාවක රතු අත් ලාම්පුව දල්වා වාහනයේ පිටුපසින් ද ආපදා සංඥාවක සුදු අත් ලාම්පුව දල්වා වාහනයේ ඉදිරි පසින් ද එම වාහනය එකී ස්ථානයෙහි නවත්වා ඇති මුළු කාලය තුලම තබා තිබිය යුතුය.